# ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

## <u>අන්තර් පළාත් මගී සේවා අවසරපත්‍ර අයිතිය පැවරීම</u>

## පැවරුම්ලාභීන් සඳහා උපදෙස් මාලාව.

## <u>1.ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම</u>

සියලුම පැවරුම්ලාභීන් විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.ntc.gov.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් මගී සේවා අවසරපත්‍ර අයිතිය පැවරීමේ ඉල්ලුම්පත්‍රය බාගත (DOWNLOAD) කර ගත යුතුය.

## <u>2.ඉල්ලුම්පත්‍ර භාරදීම.</u>

පැවරුම්ලාභියා වෙත මගී සේවා අවසරපත්‍රයේ අයිතිය පැවරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුණු බවට ලිඛිත දැනුම්දීමෙන් අනතුරුව පැවරුම්ලාභියා විසින් පහත ලබා දී ඇති උපදෙස් මාලාව අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර සහ ඊට අදාළ ලේඛණ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත මගී සේවා අවසරපත්‍රයේ පැවරුම්කරු සමග පැමිණ භාර දිය යුතුය.

**2.1 සියලුම පැවරුම්ලාභීන් විසින් සිය ඉල්ලුම්පත්‍රය සමග පහත ලේඛණ ඉදිරිපත් කල යුතුය.**

1. පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම් පත සහ එහි සහතික කරන ලද ඡායා පිටපතක් **(පැවරුම්ලාභියා සමාගමක් නම් බලය ලත් නිලධාරීන් දෙදෙනා වෙන් වෙන්ව ලබා දිය යුතු වේ)**

2. පැවරුම්ලාභියාගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ (3.5*4.5cm) වර්ණ ඡායාරූපයක් **(පැවරුම්කරු සමාගමක් නම් බලය ලත් නිලධාරීන් දෙදෙනා වෙන් වෙන්ව ලබා දිය යුතු වේ)**

3. පැවරුම්ලාභියාගේ උප්පැන්න සහතිකය සහ එහි සහතික කරන ලද පිටපතක්

4. පැවරුම්ලාභියාගේ විවාහ සහතිකය සහ එහි සහතික කරන ලද පිටපතක්

5. පැවරුම්ලාභියා නමින් පවත්වාගෙන යනු ලබන ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමට පෙරාතුවම වූ මාස හයක කාල සීමාව ආවරණය කරන රු.මිලියන 02ක ශේෂයක් පවත්වා ගෙන යනු ලබන බැංකු ප්‍රකාශවල සහතික පිටපත් රු.මිලියන 02ක ශේෂයක් පවත්වා ගත යුතු වේ.

6. පැවරුම්ලාභියා වෙත නිකුත් කරන ලද පොලිස් නිශ්කාෂණ වාර්තාව සහ ග්‍රාම නිලධාරී සහතිකය **(පැවරුම්ලාභියා සමාගමක් නම් අදාළ නොවේ.)**

7. පැවරුම්ලාභියා සමාගමක් නම් පැවරුම්ලාභියා වීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරනු ලබන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය.

8. සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද සමාගමේ වාර්ෂික ශේෂ පත්‍රයේ සහතික පිටපත.

9. එක් එක් සාක්ෂිකරුට පිටපත බැගින් සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් වල සහතික පිටපත්

10. බස්රථය ලියාපදිංචි කිරීමේ සහතිකය සහ එහි ඡායා පිටපතක්

**2.2.** **මීට අමතරව මගී සේවා අවසරපත්‍ර හිමිකරු මියගිය හෝ ඥාතීත්වය මත පැවරීම බලාත්මක කරනු ලබන අවස්ථාවක දී පැවරුම් ලාභියා පහත ලේඛණ ඉදිරිපත් කළ යුතුය.**

1. මියගිය අවසරපත්‍ර හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක් .(එහි ඡායාරූපය අපැහැදිලිනම් ඒ සමග මියගිය අවසරපත්‍ර හිමිකරුගේ මියයාමට පෙර ලබාගත් විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක්)

2. අවසරපත්‍ර හිමිකරු සමග ඇති ඥාතීත්වය තහවුරු කිරීමටදිවුරුම් කොමසාරිස් වරයකු ඉදිපිට අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්

**2.3** **කලත්‍රයා,දෙමවුපියකු,වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ කරනලද දරුවකු හෝ සහෝදරයකු පැවරුම් ලාභියා වන අවස්ථාවක දී ඉහත නිශ්චිතව දක්වා ඇති ලේඛන වලට අමතරව,පහත දැක්වෙන ලේඛන අදාළ පරිදි ඉදිරිපත් කළ යුතුය.**

1. මියගිය අවසරපත්‍ර හිමිකරුගේ උප්පැන්න සහතිකය හා එහි සහතික පිටපතක්
2. මියගිය අවසරපත්‍ර හිමිකරුගේ විවාහ සහතිකය හා එහි සහතික පිටපතක්
3. මියගිය අවසරපත්‍ර හිමිකරුගේ කලත්‍රයාගේ උප්පැන්න සහතිකය හා එහි සහතික පිටපතක්
4. මියගිය අවසරපත්‍ර හිමිකරුගේ මගී සේවා අවසරපත්‍රය පැවරීමට අදාළ දරුවාගේ උප්පැන්න සහතිකය හා එහි සහතික පිටපතක්
5. මියගිය අවසරපත්‍ර හිමිකරුගේ මගී සේවා අවසරපත්‍රය පැවරීමට අදාළ දෙමවුපියන්ගේ උප්පැන්න සහතිකය හා එහි සහතික පිටපතක්
6. මියගිය අවසරපත්‍ර හිමිකරුගේ මගී සේවා අවසරපත්‍රය පැවරීමට අදාළ සහෝදරයාගේ උප්පැන්න සහතිකය හා එහි සහතික පිටපතක්

**2.4පැවරුම් ලාභියා විසින් මගී සේවා අවසරපත්‍රයක් පවරාගැනීමේ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී අදාළ බස්රථය සමග ඊට අදාලව පහතින් දක්වා ඇති ලේඛන ද ඉදිරිපත් කල යුතුය.**

1. බස්රථයේ ලියාපදිංචි සහතිකය හා එහි ඡායා පිටපතක්
2. රක්ෂණ සහතිකය
3. අදාළ බස් රථය
4. වාහනයේ යෝග්‍යතා සහතිකය
5. අදාළ වර්ෂය සඳහා වන ආදායම් බලපත්‍රය සහ වායු විමෝචන සහතිකය
6. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පිරිවිතර පරීක්ෂණ වාර්ථාව
7. ස්ථිර රියදුරුගේ ජා.ග.කො.ස.හැඳුනුම්පත සහ එහි ඡායා පිටපතක්
8. අතිරේක රියදුරුගේ ජා.ග.කො.ස.හැඳුනුම්පත සහ එහි ඡායා පිටපතක්
9. කොන්දොස්තර වරයාගේ ජා.ග.කො.ස.හැඳුනුම්පත සහ එහි ඡායා පිටපතක්

**** පැවරුම් ලාභියා විසින් මගී සේවා අවසරපත්‍රය පවරා ගැනීම සඳහා ඉහත ලබා දී ඇති උපදෙස් මාලාව අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර සහ ඊට අදාළ ලේඛණ, භාරදීම අදාළ බස්රථයේ සන්තකය ලබා ගැනීමෙන් හා (203 වන අධිකාරය වූ)මෝටර් වාහන පනතේ 9 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකය ලබාගැනීමෙන් සතියක් ඇතුලත දී සිදුකළ යුතුය. එහිදී පැවරුම්ලාභියා විසින් වලංගු මගී සේවා අවසරපත්‍රයක් පැවරීම සඳහා වන ඉල්ලුම්පත්‍ර ගාස්තුව වන රුපියල් පන්දහසක (රු 5,000.00)ගාස්තුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය.**

ජාතික ගමනාගමන කොමිෂන් සභාව
**ක්ෂණික ඇමතුම්:1955** දුරකථන - **2587372** ෆැක්ස් - **2058138**